# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 45 දරන
# සංවර්ධන සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 7 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූලි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි | තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 45 දරන සංවර්ධන සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 7 වන දින]

එල්. ඩී.--ඕ. 33/81.

## 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 45 දරන සංවර්ධන සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 17 වන වගන්ති යට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ 17අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— *1980 අංක 35 දරන පනතෙහි 17අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*"ග්‍රාමෝදය මණ්ඩල සහ ප්‍රාදේශිය මණ්ඩල පිහිටුවීම සහ ඒවායේ කර්තව්‍ය.*

17අ. (1) සංවර්ධන සභාවල සහ සංවර්ධන සභාවල විධායක කමිටුවල මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා ජනතාව වඩාත් ඵලදායී ලෙස සහභාගි කරවා ගැනීම සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා සෑම ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයක ම ග්‍රාමෝදය මණ්ඩලයක් ද සෑම උප දිසාපති කොට්ඨාසයක ම ප්‍රාදේශිය මණ්ඩලයක් ද පිහිටුවිනු ලැබිය යුතු ය.

(2) සෑම ග්‍රාමෝදය මණ්ඩලයක් ම—

(අ) දේශපාලන ස්වභාවයකින් යුක්ත නොවූ යම් සංවිධානයක්, සමිතියක් හෝ මණ්ඩලයක් නියෝජනය කරන්නේ යම් සම්බන්ධතා ද නැතහොත් සේවය කරන්නේ යම් සම්බන්ධතා උදෙසා ද ඒ සම්බන්ධතා කෙරෙහි සැලකිලිමත්ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද අමාත්‍යවරයාගේ මතය අනුව යම් ග්‍රාමෝදය මණ්ඩලයක නියෝජනය විය යුතු වූ ද ඒ සෑම සංවිධානයක, සමිතියක හෝ මණ්ඩලයක සභාපතිවරයාගෙන් සහ ප්‍රධානයාගෙන් සමන්විත විය යුතු ය; තව ද

(ආ) ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයෙහි සේවය කරන්නා වූ ද අදාළ අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නමින් හෝ නිල යෙන් නම් කරනු ලබන්නා වූ ද රජයේ නිලධරයන් හෝ රාජ්‍ය සංස්ථා නිලධර යන් යම් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය:

එසේ වුව ද එවැනි කිසිම නිලධරයකුට ග්‍රාමෝදය මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ හිමිකම නොතිබිය යුතු ය.

(3) (අ) ග්‍රාමෝදය මණ්ඩලයක සභාපතිවරයා ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් තෝරා පත් කර ගත යුතු ය.

(ආ) ග්‍රාමෝදය මණ්ඩලයක සභාපතිවරයාගේ ධුර කාලය එක් අවුරුද්දක් විය යුතු ය:

එසේ වුව ද එවැනි සභාපතිවරයකුගේ ධුරය,—

(i) තමා ඉල්ලා අස්වන බව ඔහු විසින් ග්‍රාමෝදය මණ්ඩලයෙහි ලේකම්වරයා වෙත ලියවිල්ලකින් දන්වා යවනු ලැබූ විට;

(ii) ඔහු ග්‍රාමෝදය මණ්ඩලයෙහි සාමාජිකයකුව සිටීම අවසන් වූ විට;

(iii) ග්‍රාමෝදය මණ්ඩලයේ අවසරය කලින් ලබා නොගෙන එහි යම් අනුක්‍රමික රැස්වීම් තුනකට ඔහු සහභාගි නොවී සිටි විට; හෝ

(iv) ඔහු මිය ගිය විට

හිස් වන්නේ ය.

(4) සෑම ප්‍රාදේශීය මණ්ඩලයක් ම—

(අ) යම් ග්‍රාමෝදය මණ්ඩලයක් පිහිටුවනු ලැබ ඇත්තේ යම් උප දිසාපතිවරයකුගේ කොට්ඨාසය තුළ ද ඒ එක් එක් මණ්ඩල යේ සභාපතිවරයාගෙන් සමන්විත විය යුතු ය; තව ද

(ආ) උප දිසාපතිවරයාගේ කොට්ඨාසයෙහි සේවය කරන්නා වූ ද අදාළ අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නමින් හෝ නිලයෙන් නම් කරනු ලබන්නා වූ ද රජයේ නිලධරයන් හෝ රාජ්‍ය සංස්ථා නිලධරයන් යම් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය:

එසේ වුව ද එවැනි කිසිම නිලධරයකුට ප්‍රාදේශීය මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ හිමිකම නොතිබිය යුතු ය.

(5) (අ) ප්‍රාදේශීය මණ්ඩලයක සභාපතිවරයා ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් තෝරා පත් කර ගත යුතු ය.

(ආ) ප්‍රාදේශීය මණ්ඩලයක සභාපතිවරයාගේ ධුර කාලය එක් අවුරුද්දක් විය යුතු ය:

එසේ වුව ද, එවැනි සභාපතිවරයකුගේ ධුරය,—

(i) තමා ඉල්ලා අස්වන බව ඔහු විසින් ප්‍රාදේශීය මණ්ඩලයෙහි ලේකම්වරයා වෙත ලියවිලි ලකින් දන්වා යවනු ලැබූ විට;

(ii) ඔහු ප්‍රාදේශීය මණ්ඩලයෙහි සාමාජිකයකුව සිටීම අවසන් වූ විට;

(iii) ප්‍රාදේශීය මණ්ඩලයේ අවසරය කලින් ලබා නොගෙන එහි යම් අනුක්‍රමික රැස්වීම් තුනකට ඔහු සහභාගි නොවී සිටි විට; හෝ

(iv) ඔහු මිය ගිය විට

හිස් වන්නේ ය.

(6) (අ) සංවර්ධන සභාවේ සහ සංවර්ධන සභාවේ විධායක කමිටුවේ මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් සෑම ග්‍රාමෝදය මණ්ඩලයක් විසින් ම එහි නිර්දේශ, ඒ ග්‍රාමෝදය මණ්ඩලය පිහිටුවනු ලැබ ඇත්තේ යම් උප දිසාපතිවරයකුගේ කොට්ඨාසයක් තුළ ද ඒ කොට්ඨාසයේ ප්‍රාදේශීය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ ග්‍රාමෝදය මණ්ඩලයේ නිර්දේශ ලැබුණු විට, ඒ නිර්දේශ සලකා බලා, අවස්ථාවෝචිත පරිදි, සංවර්ධන සභාව වෙත හෝ සංවර්ධන සභාවේ විධායක කමිටුව වෙත හෝ තම නිර්දේශ ඉදිරිපත් කිරීම ඒ ප්‍රාදේශීය මණ්ඩලයේ කාර්යය විය යුතු ය ; තව ද අවස්ථාවෝචිත පරිදි, ඒ සංවර්ධන සභාවේ හෝ විධායක කමිටුවේ මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කාර්තව්‍ය ඉටු කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, ඒ සංවර්ධන සභාව විසින් නැතහොත් සංවර්ධන සභාවේ විධායක කමිටුව විසින් ඒ නිර්දේශ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(7) අවස්ථාවෝචිත පරිදි, යම් සංවර්ධන සභාවක් වෙත හෝ විධායක කමිටුවක් වෙත හෝ නිර්දේශ ලැබ නොතිබීමෙ හෝ යථා පරිදි සංස්ථාපනය කරනු නොලැබූ, අවස්ථාවෝචිත පරිදි,

ග්‍රාමෝදය මණ්ඩලයක් නැතහොත් ප්‍රාදේශීය මණ්ඩලයක් විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබ තිබීමේ හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ ග්‍රාමෝදය මණ්ඩලයේ නැතහොත් ප්‍රාදේශීය මණ්ඩලයේ කටයුතු කරගෙන යාමේ දී කිසියම් අක්‍රමිකතාවක් තිබීමේ හෝ හේතුවෙන් අවස්ථාවෝචිත පරිදි, එවැනි සංවර්ධන සභාවක නැතහොත් සංවර්ධන සභාවක විධායක කමිටුවක බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා කරන ලද කිසිම ක්‍රියාවක් හෝ ගන්නා ලද කිසිම තීරණයක් අවලංගු නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) (අ) නියමිත යයි මේ පනතින් ප්‍රකාශ කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් ; සහ

(ආ) සංවර්ධන සභාවක් විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද—

(i) සංවර්ධන සභාවල කටයුතු කරගෙන යාම සඳහා වූ කාර්ය පටිපාටිය ;

(ii) සංවර්ධන සභාවල ගිණුම් තැබීමේ කාර්ය පටිපාටිය සහ මුදල් පිළිබඳ කාර්ය පටිපාටිය ; සහ

(iii) ග්‍රාමෝදය මණ්ඩලවල සහ ප්‍රාදේශීය මණ්ඩලවල කටයුතු කරගෙන යාම සඳහා වූ කාර්ය පටිපාටිය සහ ඒ මණ්ඩල විසින් කාර්ය ඉටු කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය

යන මේ සියලු කාරණා හෝ ඉන් යම් කිසි කාරණයක් සම්බන්ධයෙන්

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.".